327

RARE

# භික්ෂුණී විනයෙන් හෙළිවන කාන්තා චරිත සංවර්ධන සංකල්පය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

එච්. ආර්. නිශාදිනී පීරිස්

327
වර්ග අංකය

කැලණිය විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරනලද නිබන්ධය

2004

# සංක්ෂේපය.

මෙම නිබන්ධනය භික්ෂුණී විනය ශික්ෂා මගින් සිදුවන චරිත සංවර්ධනය පිළිබඳ අධ්‍යයනය කිරීමේ අරමුණින් සිදුකළ පරීක්ෂණයක ප්‍රතිඵලයකි. ප්‍රාග් බෞද්ධ යුගයෙහි භාරතීය සමාජ ආකල්ප ඔස්සේ ගොඩනැගුණු කාන්තා චරිත ලක්ෂණ අධ්‍යයනයට ලක්නොකර කාන්තාව පිළිබඳ බෞද්ධ ආකල්පය හඳුනාගැනීම අපහසුය. එම නිසා ප්‍රාග් බෞද්ධ යුගයෙහි භාරතීය කාන්තාව පිළිබඳ අධ්‍යයනයට පළමු පරිච්ඡේදයත් සමාජය විෂයෙහි කාන්තාව සතු කාර්යභාරය හා ඇයට හිමි ස්ථානය පිළිබඳ බෞද්ධ ආකල්පය හඳුනාගැනීමට දෙවන පරිච්ඡේදයත් වෙන්කර ඇත. භික්ෂුණී සමාජයෙහි ආරම්භය කාන්තාව පිළිබඳ බෞද්ධ ආකල්පය ක්‍රියාවට නැංවීමක් ලෙස හැඳින්විය හැක. බුද්ධකාලීනව හා ඉන් අනතුරුව භික්ෂුණී සමාජය ලැබූ ව්‍යාප්තිය ප්‍රකට කරන්නේ, කාන්තාව පිළිබඳ වඩාත් නිදහස් හා විවෘත ආකල්පයක් ක්‍රියාවට නැංවීම, එවන විට පැවති ප්‍රධාන සමාජ අවශ්‍යතාවක්ව පැවති බවයි. බුදුසසුන තුළ කාන්තා පැවිද්ද අනුදැනීම අරබයා සූත්‍ර විනය පිටක හා අටුවාවල ගොණුව ඇති කරුණු සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමටත්, භික්ෂුණී සමාජය බුද්ධකාලීනව අත්කරගත් ව්‍යාප්තිය විමසා බැලීමටත්, තෙවන පරිච්ජෙදය වෙන්කර ඇත්තේ එහෙයිනි. මූලික වශයෙන් තෙවන පරිච්ජෙදයටත්, හතරවන හා පස්වන පරිච්ජෙදවලටත් ආධාරකයක් ලෙස තෙවන පරිච්ජෙදයට උපග්‍රන්ථයක් එක්කර ඇත.

ප්‍රථමාභිසම්බෝධියේදී සංඝ සමාජය සංවරවූයේ විනය ශික්ෂාවල ආධාරයකින් තොරවය. බුදුරදුනට අනුව එම යුගයේදී විමුක්තිලාභීහුද බහුල වූහ. එසේනම් විනය ශික්ෂා පැණවීමේ අවශ්‍යතාව පැණනැගුනේ මන්ද? විනය මගින් සංඝයාගේ සංවරය විෂයෙහි දක්වන දායකත්වය කුමක්ද? සිව්වන පරිච්ජෙදය මේ පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක යෙදීමට යොදාගෙන ඇත. පස්වන පරිච්ජෙදය විනය ශික්ෂා මගින් අපේක්ෂිත වූ චරිත සංවර්ධනය කෙබඳු ආකාරයක් ගනීද යන්න භික්ෂුණී ප්‍රාතිමොක්ෂය හා භික්ෂුණීනට පමණක් අදාල සෙසු විනය ශික්ෂා ඇසුරින්, අධ්‍යයනය කිරීමෙහි ප්‍රතිඵලයකි. එහිදී විනය ශික්ෂා මගින් අපේක්ෂිත අරමුණ අනුව ඒවා වර්ගීකරණයකට ලක්කරඇත.

බුදුසමය දක්වන පෞරුෂ සංවර්ධනය කෙබඳුද? එය නූතන සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක මත හා සැසැඳිය හැකිද? බුදුසමය දක්වන පෞරුෂ සංවර්ධනය කාන්තාව විෂයෙහි කළ බලපෑම කෙබඳු ද? යන්න අධ්‍යයනයට බඳුන් කිරීම හයවන පරිච්ජෙදයේ අරමුණයි. ඉහත පරිච්ජෙද ඔස්සේ සාකච්ඡාවට බඳුන් වූ කරුණු අනුව එළඹිය හැකි නිගමනය හත්වන පරිච්ජෙදයේ දැක්වේ.